# මහායාන බෞද්ධ ස්තූප කලාවේ ලක්‍ෂණ

ආචාර්ය දුනුකේඋල්ලේ සාරානන්ද හිමි

As a result of various political, religious, economic and social factors, Buddhism has spread in many countries, especially in Asia. Those Asian countries have been influenced by the two traditions of Buddhist Thought, Theravada and Mahayana. The countries that have been influenced by the Mahayana Buddhist Thought have developed an architectural tradition of their own. "*Pagoda*" which is also known as "*Watch tower*" or "*pavilion*" is a concept developed under this tradition. This concept of *Pagoda* came to China along with Mahayana Buddhism. The *Stupa* of India quickly blended in with the Chinese *Pagoda* to result a unique Chinese style of *Stupa.* One of the notable characters of the Chinese *Pagoda* is that there is a pavilion at the base of the *Stupa*. In the course of time this concept has influenced the architectural traditions in countries like Japan, Korea and Vietnam.

---

© ආචාර්ය දුනුකේඋල්ලේ සාරානන්ද හිමි

සංස්. ජයමල් ද සිල්වා, දිල්ශාන් මනෝජ් රාජපක්ෂ, දුලන්කා ලංසකාර, දිනේෂ් සඳරුවන්
'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, තුන් වැනි කලාපය - 2013/2014
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

භාරතයේ සිට මධ්‍ය ආසියාව ඔස්සේ නැගෙනහිර ආසියාවට සපැමිණි බුදු සමය ප්‍රධාන වශයෙන් චීනය, ජපානය හා කොරියාව යන රටවල ව්‍යාප්ත වන්නට විය.[1] ඉන් අනතුරු ව උක්ත කලාපයේ දේශීය අනන්‍යතා සහිත සංස්කෘතිකාංග නිර්මාණය වන්නට විය. එකී සංස්කෘතිකාංග අතර කලාත්මක අංගවලට ද සුවිශේෂ ස්ථානයක් හිමි විය. මහායාන සම්ප්‍රදායය මූලික කරගනිමින් තත් කලාපයේ නිර්මාණය වූ බොහෝ වාස්තු විද්‍යාත්මක නිර්මාණ ස්වදේශීය ලක්ෂණවලින් සමන්විත විය. ඊට අනුරූප ව රාජ්‍ය අතර ද ස්වදේශීය ලක්ෂණ අනුව ස්තූපය නිර්මාණය විය. එකී ස්තූපය "pagoda" යන අන්වර්ථ නාමයෙන් හඳුන්වන්ට විය.

## චීන ස්තූපයෙහි කලාත්මක ලක්ෂණ

චීනයට බුදු සමයේ උදාව ලැබී දැනට වසර දෙ දහසකට වැඩි කාලයක් ගත වී ඇත. වර්තමාන චීනයේ හන් චීන වැසියන් අතර හන් බුදු සමය ඉතා ජනප්‍රිය ව පවතී. ලෝකයේ විශාලතම දේශය වන චීනය බුදු දහම කෙරෙහි නැඹුරුවක් දැක්වූ රටකි. බුදු සමයේ මූලික සංකල්ප අවබෝධ කිරීමට මෙතරම් උනන්දුවක් දැක්වූ අන් රටක් ලෝකයෙහි නැතැ යි කියනු ලැබේ. ආසියාවේ බෞද්ධ ලෝකය ලෙස සැලැකිය හැකි චීනය බෞද්ධ කලා නිර්මාණවලින් දෙ වැනි වනුයේ ඉන්දියාවට පමණි.[2] නැගෙනහිර ආසියාවේ බෞද්ධ කලා නිකේතනය වන චීනය පුදුම එළවන කලා කෘති සමුදායකට උරුමකම් කියයි.

චීනයට බුද්ධාගම සම්ප්‍රාප්ත වූයේ ක්‍රි.ව. 62 දී කාශ්‍යපමාතංග හා ධර්මරාක්ෂ (Zhu Fahu 233 – 310C.E.)[3] නම් භික්ෂු දෙ නම චීන අධිරාජයාගේ ඇරියුමක් පරිදි ලෝයං නම් අගනුවරට පැමිණීම හේතු යුක්ත කොටගෙන බව ඓතිහාසික වාර්තා අනාවරණය කරයි. මීට පෙර අශෝක සමයේ දී ඉන්දීය භික්ෂූන් දහ අට නමක් චීනයට බෞද්ධ පොත්පත් රැගෙන යන්නට කළ උත්සාහය ව්‍යර්ථ වී ඇත. කෙසේ වුවත් මධ්‍ය ආසියාවේ සිට පැමිණි ධර්මාකර භික්ෂුවගෙන් චීනයට බුදු සමය උදා වූ බව ඉතිහාසය පිළිගනී.[4]

වයඹ දිග ඉන්දීය ගෘහ නිර්මාණ ශිල්පය මධ්‍ය ආසියාවේ බලපෑම් සහිත ව චීනයට පැමිණීමේ දී ආරාමවල සැලැස්ම බොහෝ සෙයින් ඉන්දීය වුව ද එහි සැරසිලි ආදිය ස්වදේශීය ක්‍රමයෙන් යුක්ත විය. ආරාමයේ මධ්‍යගත ව ස්තූපය එලෙස ම පැවැතුණේ ය. චීන විහාරයේ සැලැස්ම ස්වදේශීය ගෘහ සැලැස්මට අනුගත ව ක්‍රමයෙන් වැඩි දියුණු විය. ඒවා හන් යුගයේ (Han dynasty 25 B.C.E- 220C.E)[5] මාළිගාවට අනුරූප ව නිර්මාණය කරන ලදැ යි සඳහන් වේ. ස්තූපයේ ආකෘතිය ද මධ්‍ය ආසියාවෙන් පැමිණීමේ දී නොයෙක් ස්වදේශීය ලක්ෂණ එයට එක් විය. මධ්‍ය ආසියා රටවල මුර කුලුනු (watch towers) අනුගමනය කරමින් ස්තම්භාකාර ස්තූප ක්‍රමයෙන් ආරම්භ විය. චීන මුර කුලුනු කලාව ක්‍රිස්තු පූර්ව යුගයට පසු හෝ ක්‍රිස්තු වර්ෂයට පූර්වයෙහි නිර්මාණය වන්නට ඇතැ යි කරුණු අනාවරණය වේ.[6] උතුරු වෙයි අගනුවර හනාන්හි ලුවෝයැන්ග්හි 1367ක් පමණ වන බෞද්ධ ඉදිකිරීම් දක්නට ලැබෙන අතර එයට පැගෝඩා කිහිපයක් ද ඇතුළත් වේ.

ස්තූපය මධ්‍ය ආසියාව හරහා චීනයට පැමිණීමේ දී එහි ඇති වූ පරිණාමයක් වන්නේ චීනයේ දී ස්තූපය “pagoda” නමින් හැඳින්වීම යි. චීනයේ මෙන් ම ජපානයේ ද බුරුම හා සියම් රටවල ද මේ ව්‍යවහාරය පවතී. එහෙත් පැගෝඩා යන්න පිළිබඳ සාර්ථක අර්ථකථනයක් සිදු කොට නොමැත. මූලික ස්තූපයේ අනුගමනය වූ ශාරීරික ධාතු නිධන් කිරීම් මේ වන විට සම්පූර්ණයෙන් ම අමතක ව තිබේ. පසු ව බොහෝ සෙයින් ස්තූපය ස්මාරකයක් හෝ ප්‍රතිමා සහිත ව වන්දනයට උපයෝගී කොටගත් ගොඩනැඟිල්ලක් වූයෙන් මේ වචනය මෙකී රටවල දී වඩාත් උචිත විය.

මෙතෙක් දැක්වූ සියලු සාධක එක් කොටගත් කල්හි ඈත පෙරදිග, විශේෂයෙන් ම චීනයේ ස්තූප ක්‍රමය කොටස් තුනකට බෙදා දැක්විය හැකි ය.

01. මඳ වශයෙන් වෙන් වූ ඉන්දීය ආකෘතිය
02. චීන මණ්ඩප (pavilion) ක්‍රමය අනුගත ව විකාසනය වූ (pagoda ) ස්තූපය
03. මුර කුලුනු (watch towers) ආකෘතිය විකාසනයෙන් පහළ වූ (pagoda) ස්තූපය[7]

## ඉන්දීය ආකෘතිය

චීනයට ස්තූපය හඳුන්වාදෙන ලද්දේ මධ්‍ය ආසියාවේ සිට ය. මධ්‍ය ආසියාවට බුදු සමයේ ආභාසය උදා වූයේ ගන්ධාර කලාවේ ආභාසයෙන් වයඹ දිග ඉන්දියාවේ ඉදි වූ ස්තූප මඟිනි. එහි ලා ඉතා විශිෂ්ට නිර්මාණය නම් පැෂවෝරයේ (shah - siki - dheri) නම් ස්ථානයේ පිහිටි කණිෂ්ක ස්තූපය යි.

මෙය දුටු ෆාහියන්, සුං යුං හා හියුං සාං වැනි චීන දේශාටකයන්ගේ වාර්තා විස්මය දනවන විස්තරවලින් යුක්ත ය. ඒ අතර සුං යුං තෙරණුවන් මේ ස්තූපය ත්සිඹ් - ලි යන විශේෂ නාමයකින් හඳුන්වා ඇත. මේ දාගැබේ චිත්‍රයක් චිත්‍ර ශිල්පියකු මුදල් ගෙවා තඹ පතක සටහන් කරගත් බව සුං යුං තෙරුන්ගේ වාර්තාවේ සඳහන් වේ. එමඟින් සිය රටට ගෙන ගිය මේ ස්තූප සැලැස්ම කෙලින් ම චීනයට හඳුන්වාදෙන ලදි.

මෙවැනි ස්තූප මධ්‍ය ආසියාවේ වැලි කතරින් මතු කොටගෙන ඇත. වර්තමානයේ ඇති පුරාතන ස්තූපවල මේ ලක්ෂණ ප්‍රතිසංස්කරණ හේතුවෙන් බොහෝ දුරට කැඩී ඇත. එහෙත් චීනයේ පීකිං කෞතුකාගාරයේ තිබෙන ස්වර්ණ ස්තූපය ඉන්දීය ස්වරූපය දරයි. එසේ ම පීකිං බටහිර උද්‍යානයේ බියුෂ ස්තූපයේ ද ඉන්දීය ලක්ෂණ නො මැකී ඇත.[8]

## ස්වදේශීය මණ්ඩප (Pavilion)

චීනයේ කැන්ටන්හි සුප්‍රසිද්ධ ලුං යුං ස්තූපය අටපට්ටම් මාළක හතකින් යුක්ත වූ අලංකාර ස්තූපයක් වේ. හැම මාළකයක් පාසා ම කෙටි වහල අයෝම පලංක රදවා තිබේ. නිල් පැහැ උළු වසා ඇති වහල හා එහි කොන් අට උඩට නෙරා ඇත. පියසි අග වර්ණවත් කළ පෝතකයන්ගෙන් හා විචිත්‍ර සීනුවලින් සරසා ඇත. හැම අක්ෂයක ම බිත්තිය මත වීදුරු යෙදූ බිත්ති ඇත. ඉහළට නැගීමට පඩි පෙළ අභ්‍යන්තරයෙන් යොදා ඇත. මුදුනෙහි සවි කළ ඡත්‍ර දොළසක් කෝණාකාර ව දක්නට ලැබේ.

මෙවන් ආකෘති චීන කලාවේ විශේෂ ලක්ෂණ වේ. ටිඑන් - නින්ග් - ස්ෂු (tien - ning - ssu) ස්තූපය ද පළමු කී ක්‍රමයට අයත් ස්තූපයකි. එහෙත් ඒ ස්තූපය ක්‍රි.ව. 1100 දී ඉදි කරන ලද හෙයින් වඩාත් පැරණි ලක්ෂණ ඉතිරි ව පවතී. එහි පදනමට ඉහළින් කොටස වහල නොමැති උස් පාදමකින් පෙන්වා ඒ බිත්ති අට පැත්තෙහි ප්‍රතිමා තබා ඇත. ඉන් ඉහළ කොටස වන වහල පළ සහිත ය. මුදුන කොත් කැරැල්ලක ආකෘතියට සමාන ය. පළමු වැනි ස්තූපයේ පරිද්දෙන් දොරවල් නොමැති අතර මහල් 13කි. වහල කොළ හා කහ උළුවලින් සමන්විත ය. මේ විකාසනයට බහු මහල් හා බහු කෝණික ස්තූප යැ යි කියනු ලැබේ. ජපානය කෙරෙහි මෙහි තද බලපෑමක් සිදු විය.

## ස්වදේශීය මුර කුලුනු (watch towers) ආකෘතිය

මෙය මධ්‍ය ආසියානු මුර කුලුනු ආභාසයෙන් ගොඩනැගුණු බව සැලැකේ. එනමුදු එය හැං අධිරාජ්‍ය යුගයේ කුඹල්කරුවකුගේ ආකෘතියක් ලෙස ද සැලැකේ.[9] ජපානය, කොරියාව, නේපාලය, බුරුමය වැනි රටවල මෙය ව්‍යාප්ත විය. මෙය බොහෝ සෙයින් තට්ටු වශයෙන් හෝ මහල් සෙරු පනා බැමි සහිත ව ඉහළට කුඩා වෙමින් නැඟී යයි. ඉහළ මුදුන ලන්තෑරුම් වහල ලෙස හඳුන්වන කුඩා මඳ බෑවුම් වහල ආසියාවේ ඉහළ මුදුන් කුහරය මේ වහලෙන් වසා ඇත.

චීනයේ ෂැන්සි ප්‍රදේශයේ සියං නගරය මැද ගොඩනඟා ඇති තායං ස්තූපය[10] ක්‍රි.ව. 652ට අයත් ය. සතරැස් මුල් පාදම අඩි 82ක් වන අතර මාළකයක් පාසා ක්‍රමයෙන් කුඩා වන එහි මාළකයක ම සිවු පස කවුළු එක බැගින් හරි මැද පිහිටා ඇත. අඩි 182ක් උස් වූ මේ ස්තූපය මාළක 16කින් සමන්විත ය. එහි ඇතුළත බිත්තිවල චිත්‍ර හා කරඬු ආදිය දක්නට ලැබේ.

චීනයේ හනාන් (Henan) ප්‍රදේශයේ පිහිටි ශ්වේත අස්වරාරාමය නම් චීන මුල් ම විහාරයෙහි ස්තූපයක් ඇත. ක්‍රි.ව. 707ට අයත් යැ යි සලකන මේ ස්තූපයේ උස අඩි සියයකි. මෙයින් විශ්වය නිරූපණය වේ යැ යි ජනප්‍රවාදයේ කියැවේ.

## ජපන් ස්තූපයේ කලාත්මක ලක්ෂණ

ජපානයට බුදු දහම හඳුන්වාදෙන ලද්දේ කොරියාව විසිනි. ඒ තිළිණයක් ලෙස ය. කිං මෙයි රජු දවස ජපානයට බුදු දහම ලැබුණු බව ඓතිහාසික වාර්තා ගෙන හැර දක්වයි. ජපන් බුදු සමයේ ෂෝතු කුතයි ෂී රාජ්‍ය සමය ස්වර්ණමය යුගය ලෙස හැඳින්වේ. විවිධ වෙනස්කම්වලට, බාධකවලට හා සංවර්ධනයට ලක් වෙමින් අද දක්වා බුදු සමය ජපානයේ ස්ථාපිත ය.

ජපන් ජාතිකයාගේ ජාතිකත්ව ආකෘතිය ඒ හැම මාධ්‍යයක් කෙරෙහි ම බලපෑ බව සත්‍යයකි. එනමුත් බෞද්ධ ආගමික සියල්ල කෙරෙහි ඔවුන් බහුල වශයෙන් නැඹුරු වූයේ චීනය දෙසට ය. ජපානයට ස්තූපය හඳුන්වාදෙන ලද්දේ ද චීනය යි. එහෙත් ජපානයේ මූලිකත්වයක් හිමි වූයේ චීන මණ්ඩප (pavilion) ශෛලියට ය. දැනට සම්භාව්‍ය යැ යි සැලැකෙන ජපානයේ බොහෝ ස්තූප ගැනෙන්නේ චීන මණ්ඩප ශෛලියට ය.

ෂෝතුකුතයිෂී රාජ්‍ය සමයේ බොහෝ ස්තූප ඉදි කරන ලද බව සඳහන් වේ. ඒවායේ මුල් ආකෘති දැකිය හැක්කේ ඉතා සුළු වශයෙනි. නාරා (Nara period 645 - 794 C.E) නගරයේ හොර්යුජි (Horyuji)[11] ස්තූපය විශේෂ ස්ථානයක් හිමි කරගනී. එහි මුල් වේදිකාව චතුරශ්‍රාකාර ය. කපා කොටා ඔපමට්ටම් කළ ගල්වලින් එය ගොඩනංවා ඇත. සිවු දෙසින් දොරටු සතරකි. එය වටා චතුරශ්‍රාකාර වහල් පළ නංවා ඇත. ඉන් අනතුරු ව ක්‍රමයෙන් ගොඩනංවන ලද වහල සහිත මහල් පහකි. උඩ කොටස සම්පූර්ණයෙන් දැවයෙන් යුක්ත ය. මේ නිසා ම ජපානයේ මේ ස්තූප ලෝකයේ ඉපැරැණි ම දාරුමය ගෘහ ලෙස හඳුන්වනු ලැබේ. කොත් වහන්සේ උඩට නෙරා සිටින අයුරින් හා විශාල ලෙස පිටට පැන්නූ කොත්වලින් යුක්ත ය. මේ ස්තූපයෙහි මෙවැනි මාළක පසෙකි. ඒ මත අයෝමය ස්තම්භයක් මත කුඩා කැටයම් කළ පෙති සමූහයක් මඟින් ඡත්‍රාවලිය නිර්මාණාත්මක ව පෙන්වා ඇත. මේ ස්තූපය ක්‍රි.ව. 707 දී ගොඩනංවන ලද නමුදු කිහිප වතාවක් ප්‍රතිසංස්කරණය කොට ඇත.[12]

නාරාවේ ම ඇති තවත් ස්තූපයක් නම් යකුෂජී[13] දැව ස්තූපය යි. ක්‍රි.ව. 680 දී ගොඩනංවන ලද මෙය අඩි එක සීය පහළොවක උසින් යුක්ත ය. මහල් හයකින් යුත් මෙය දැවයෙන් ම නිමවා ඇත. එහි විශේෂත්වය නම් විශාල ඡත්‍ර තුනක් අතර තවත් කුඩා ඡත්‍ර තුනක් පෙන්වා තිබීම යි. දයිතොජී[14] නම් ස්ථානයේ දක්නට ලැබෙන ජපන් ස්තූපයෙහි වහල් පළ දෙකකි. එහි පළ අතර කොටස රවුම් හැඩයෙන් යුක්ත නිසා එහි ඉන්දීය ලක්ෂණ දැකිය හැකි ය.

මෙලෙස ජපන් ස්තූපය චීන ආභාසය ලැබුව ද ජපන් ස්වදේශීය ලක්ෂණ වඩාත් අලංකාර සම්භාව්‍ය තත්ත්වයක් ලබා ඇත. චීනයේ ස්තූපය ඡදනය ඇතුළු සියල්ල බාහිර අංගවලින් සමන්විත ය. ජපන් ස්තූපය බාහිර අලංකාරවලින් සමන්විත නො වුව ද චීන ස්තූපයට වඩා උදාර පෙනුමක් එහි ඇත.

එමෙන් ම ජපන් ස්තූපයේ ඡත්‍රයේ සිට පාදම දක්වා දාරුමය ස්තම්භයක් යොදා ඇත. ඇතැම් අවස්ථාවල වෛරෝචන බුද්ධ ප්‍රතිමාව ද යොදා ඇත. ඒ ස්තූපයට මඳක් දුරිනි. මේ අනුව ජපන් ස්තූපයෙන් විශ්ව සංකල්පය මනා ව නිරූපණය වේ.

## කොරියාවේ බෞද්ධ ස්තූපයෙහි කලාත්මක අනන්‍යතාව

ජපානය වරක් කොරියන් ස්තූප ක්‍රමය අනුගමනය කළ ද පසු ව චීනයේ මණ්ඩප මාළිගාව ක්‍රමය ම අනුගමනය කරන ලදි. කොරියාවේ දකුණු දෙස ස්තූප ආකෘතිය විසින් චීනයේ ස්තම්භ පැගෝඩාවේ ආකෘතිය බොහෝ සෙයින් අනුගමනය කරන ලද බව පෙනේ.[15] එහි බොහෝ විට මැද කුලුනු හතරැස් ලෙස නෙරා ගිය කුඩා වහල් පලසක් බැගින් පෙන්වා ඇත. එහෙත් මේ ඡදන වෙන වෙන ම ඉදි කළ ඒවා නො ව හතරැස් කුලුනෙන් ම පිටට විහිදුණු ශෛලමය හෙවත් ගඩොළු කර්මාන්ත ය. එසේ ම කුලුනු එක් එක් මාළකයකින් කුඩා ව ගොස් මුදුන කොතකින් හෝ කුඩා ස්තූපයකින් අවසන් වේ. මේ ආකාරයෙන් චීන පැගෝඩාව අනුගමනය කළ ද කොරියා ස්තූපයේ දැකිය හැක්කේ වඩාත් රළු පෙනුමකි. මීට වඩා වෙනස් ආකෘතියක් වශයෙන් එකිනෙක කුඩා වී ඉහළ නඟින

සමචතුරස්‍රාකාර වේදිකා හත අටක් සහිත ස්තූප කොරියාවේ දැකිය හැකි ය. මෙය පොලොන්නරුවේ සත් මහල් ප්‍රාසාද ගොඩනැඟිල්ලට බෙහෙවින් සමාන ය.

පැගෝඩාවල සියුම් සංකේතයක් ද සඳහන් වේ. සමස්ත ආකෘතිය ධාතු කරඬුවක ස්වභාවය උසුලන හෙයින් නිර්වානය හෝ පරම උත්කෘෂ්ට තත්ත්වයක් ඉන් ගම්‍ය වන බව සඳහන් වේ. බුද්ධ ප්‍රතිමාවක් ඒ තුළ තැන් පත් කිරීමේ අභිලාෂය ද විය හැකි ය. මෙහි මධ්‍යයෙහි සංකේතවත් වන කුලුනුවලින් විශ්වයේ මධ්‍යය සංකේතවත් වන බව විචාරක මතය යි. බහු කෝණ සහිත කෝණ අටින් පද්මය හෝ ධර්ම චක්‍රය සංකේතවත් වේ. වෙන් වෙන් ව නිර්මිත මන්දිරවලින් ආධ්‍යාත්මික තලය හෝ බෝධිසත්ව භූමි නිරූපණය වේ. මෙයින් ලෞකිකත්වයේ සිට ලෝකෝත්තරත්වයට යන ගමන නිරූපණය වන බව උගතුන්ගේ අදහස යි.

මේ අනුව විශ්වය සුමේරු පර්වතය හෝ බෝධිරුක්ෂය නිරූපණය වන බව ආසියාතික මතය යි. මේ අනුව මහායාන, ථෙරවාද නැති නම් මධ්‍ය ආසියාතික හා නැගෙනහිර ආසියාතික ස්තූපකරණයේ මිශ්‍රණයක් ලෙස දැක්වීමට පුළුවන. මෙලෙස සමස්තයක් ලෙස ගත් කල්හි බෞද්ධ සංස්කෘතියේ ඉගැන්වෙන ස්තූපකරණය නව මඟකට යොමු වූ බව නැගෙනහිර ආසියාතික රටවල ස්තූප අධ්‍යයනය කරන කල්හි ගම්‍යමාන වේ.

## වියෙට්නාම් බෞද්ධ ස්තූප කලාවේ අනන්‍ය ලක්ෂණ

වියෙට්නාම් රාජ්‍යයේ ප්‍රධානතම ආගම වන්නේ බුදු දහම යි. එහෙත් මේ රාජ්‍යයට බුදු දහම හඳුන්වා දී ඉතා දීර්ඝ කාලයක් නො වේ. කෙසේ වුව ද වියෙට්නාමයේ සියයට අනූවකට වැඩි පිරිසක් බෞද්ධයෝ ය.[16] Nam Quan දොරටුවේ සිට Ca Mau තුඩුව තෙක් බහුල ලෙස පැගෝඩා දක්නට ලැබේ.

ප්‍රථමයෙන් ම Pagoda යන වචනය කවර පදනමක් ඔස්සේ භාවිතයට යෙදුනේ ද යන්න අධ්‍යයනය කොට තේරුම් කරගැනීම

අතිශයින් ම වැදගත් වේ. විශේෂයෙන් බටහිර ජනතාව මෙහි පවත්නා තට්ටු ස්වභාවය නිසා උක්ත විග්‍රහය භාවිත කිරීමට පුරුදු ව සිටිති. Larousse විසින් Chapelle යන නව කෙටි විග්‍රහය ඉදිරි පත් කරන ලදි. එනමුත් මේ විග්‍රහය ද දෝෂ සහිත වූවක් විය. මේ සඳහා කදිම නිදසුනක් ලෙස ඉතා ප්‍රකට Quan Thanh විහාරස්ථානය ගෙන හැර දැක්වීමට පුළුවන. අති විශිෂ්ට Hanoi විල් ඉවුරේ ගොඩනඟා ඇති ඉතා පැරණි ස්මාරකයක් වන මෙය වියෙට්නාම් ප්‍රධාන නගරයේ සුන්දර පරිසරයක පිහිටා ඇත. සැඟැවුණු ජනප්‍රවාදයක ප්‍රකාශ වන අයුරින් එය වන්දනා කටයුතු සඳහා ඉතා ශ්‍රේෂ්ඨ තාඕයිසම් බුද්ධිමතකුට පිළිගන්වා තිබුණි. එක් අවස්ථාවක එහි තිබී බුද්ධිමතකුගේ වටිනා ප්‍රතිමාවක් සොයාගෙන තිබුණි. එය ලෝකඩින් දීප්තිමත් ලෙස නිර්මාණය කොට තිබුණි. 1884 දී වියෙට්නාමය ප්‍රංශයෙහි යටත් විජිතයක් ලෙස පවතින අතුරතුර දී ඔවුන් ප්‍රංශ බලකොටුව නිර්මාණය කිරීම ආරම්භ කරන ලද අතර, ඒ අවස්ථාවේ දී මේ පූජා භූමිය the Pagoda of the Brand Buddha යන විශේෂ නාමයෙන් හඳුන්වන්නට විය. ඒ සමඟ ම මේ ස්ථානය අතිශය පූජනීය ස්ථානයක් ලෙස සලකන්නට විය. එමෙන් ම ගොඩනැඟිලි නිර්මාණයේ දී පුද පූජා සඳහා බුදු රජාණන් වහන්සේගේ ප්‍රතිමා ද ගොඩනඟන ලදි. ඉන් අනතුරු ව වියෙට්නාම් ජනතාව පැගෝඩා හා එහි අභ්‍යන්තර ප්‍රතිමා නිර්මාණකරණය ද අර්ථවත් ලෙස සිදු කළ හ.

පැගෝඩා සතු බෝධිසත්ව පිළිම, නිශ්චිත දේව ප්‍රතිමා, ශ්‍රේෂ්ඨ ප්‍රතිභා සම්පන්න චරිත නිරූපිත ප්‍රතිමා කිසිවකු අධ්‍යයනය කරතොත් එය පුදුම විය යුතු දෙයක් නො වේ. බෝසත්භාවය බුද්ධත්වයට සමීප ව පවත්නා බවට ඔවුන් විශ්වාස කරන බැවිනි. ඒ නිසා ම ඔවුහු මේ ප්‍රතිමා ආගමික නැඹුරුතාවකින් යුක්ත ව නිර්මාණය කළ හ. Buddhist pantheon ස්වභාවික ස්ථානයක් බවට පත් වී තිබුණි. වියෙට්නාම් බෞද්ධ සංකල්ප අතිශයින් ම චීන හා ජපන් බෞද්ධ සම්ප්‍රදායයට (මහායන සම්ප්‍රදායයට) අනුගත මූලික සංකල්පවලින් සමන්විත වේ. මේ අතර විශේෂ වශයෙන් ශාක්‍යමුනි බුදු රජාණන් වහන්සේ, වෙනත් සංඛ්‍යාත්මක බුදුවරු, බෝසත්වරු, බෞද්ධ දෙවිවරු හා ප්‍රතිභාවන්ත චරිත ප්‍රධාන තැනක් හිමි කරගනිති.

කෙසේ වුවත් ශ්‍රී ලංකාව, කාම්බෝජියාව, ලාඕසය, බුරුමය, තායිලන්තය සාම්ප්‍රදායික හෙවත් ඉපැරැණි බුදු දහම අනුගමනය කරයි. එය ථෙරවාද බුදු සමය ලෙස අර්ථ විග්‍රහ කෙරෙන අතර බහු විශ්වාස ක්‍රමයට වඩා එක ම ශාක්‍යමුනි බුද්ධ සංකල්පය ම විශ්වාස කෙරේ. වියෙට්නාම්, චීන හා ජපන් බෞද්ධයෝ සමාන භක්තිකයෝ වූ හ. ඒ නිසා ම වියෙට්නාම් බෞද්ධයෝ උක්ත රටවල බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ වැඩි ඇල්මක් දැක්වූ හ. උක්ත කාරණාව හේතුවෙන් ඔවුහු Tian Do සම්ප්‍රදායයට හිමිකම් කී හ. එහි සරල තේරුම නම් Pure Land යන්න යි. මෙයින් අර්ථවත් වූයේ 'අතිශය ප්‍රීතිමත්' යන්න යි. නිවනේ පාරාදීසය ලෙස ඔවුහු මෙය හඳුනාගත් හ. දුකින් පිරුණු මේ ලෝකයෙන් මිදී Pure Landහි නැවත ඉපැදීමක් ලැබ අවසානයේ බුදුන් වහන්සේ වෙත පැමිණේ. කලින් සඳහන් කළ පරිදි චීන, ජපන් මෙන් ම වියෙට්නාම් බෞද්ධයෝ ශාක්‍යමුනි බුදුරජාණන් වහන්සේ වෙනුවට අමිතාභ බුදු රජාණන් වහන්සේ පූජ්‍යත්වයට ලක් කරති. අමිතාභ සූත්‍රයේ සමස්ත කරුණු අන්තර්ගත වේ. වියෙට්නාම් ජනතාව නිරන්තර ව මේ සූත්‍රය අධ්‍යයනය කරති. සමස්තයක් ලෙස ගෙන සලකා බලන කල්හි වියෙට්නාම් බෞද්ධ සිහිවටන හා ගොඩනැගුණු රසවත් තොරතුරු රාශියක් හඳුනාගැනීමට පුළුවන. මේ අතර අමිතාභ බුද්ධ, පැගෝඩා, අවශේෂ බුද්ධ සංකල්ප, රහතුන් වහන්සේලා පිළිබඳ සංකල්ප ගෙන හැර දැක්වීමට පුළුවන. උක්ත සියල්ල නිරූපණය කරනු වස් ප්‍රධාන වශයෙන් ප්‍රතිමා නිර්මාණ භාවිත කරන ලදි. ඒ කෙසේ වුවත් වියෙට්නාම් බෞද්ධ ඉතිහාසයේ සුවිශේෂ ස්ථානයක් පැගෝඩාවලට හිමි වන්නේ අනෙකුත් සියලු ම හේතු යුක්ති ඉක්මවමිනි.

## ආන්තික සටහන්

[1] Encyclopedia of Buddhism, Volume one, A-L, Robert E. Buswell,Jr. Editor in Chief. 140p.

[2] Encyclopedia of Buddhism, Volume one, A-L, Robert E. Buswell,Jr. Editor in Chief. 145p.

[3] *"Dharmaraksa translated a number of mainstream Buddhist works, but his most notable contributionsare large and well-known sutras as the Lotus Sutra (saddharmapundarika Sutra) , the Guangzan Jing Sutra...."*

Encyclopedia of Buddhism, Volume one, A-L, Robert E. Buswell,Jr. Editor in Chief. 225p.

[4] බෞද්ධ ස්තූප තිරාණගම රතනසාර, ආසියාවේ බෞද්ධ කලා, අංක 01, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණාලය, 1967, 115 පිටුව

[5] Encyclopedia of Buddhism, Volume one, A-L, Robert E. Buswell,Jr. Editor in Chief. 145p.

[6] Encyclopedia of Buddhism, Volume one, A-L, Robert E. Buswell,Jr. Editor in Chief. 581p.

[7] ස්තූප පුරාණය, 106 පිටුව

[8] බෞද්ධ ස්තූප, තිරාණගම රතනසාර, ආසියාවේ බෞද්ධ කලා, අංක 01, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණාලය, 1967, 117 පිටුව

[9] එම, 117 පිටුව

[10] එම, 117 පිටුව

[11] එම, 117 පිටුව

[12] Encyclopedia of Buddhism, Volume one, A-L, Robert E. Buswell,Jr. Editor in Chief. 145p.

[13] බෞද්ධ ස්තූප, තිරාණගම රතනසාර, ආසියාවේ බෞද්ධ කලා, අංක 01, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණාලය□ 1967, 114 පිටුව

[14] එම, 113 පිටුව

[15] Encyclopedia of Buddhism, Volume one, A-L, Robert E. Buswell,Jr. Editor in Chief. 555-556p.

[16] Encyclopedia of Buddhism, Volume one, A-L, Robert E. Buswell,Jr. Editor in Chief. 787p.

## මූලාශ්‍රය නාමාවලිය


තිරාණගම, රතනසාර. (1967) බෞද්ධ ස්තූප. **ආසියාවේ බෞද්ධ කලා.** අංක 1. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

Coedes, Ggorge. (1968) **The Indianized States of Southeast Asia**. (translated by Susan Brown Cowing). Honolulu: East West Center Press.

Robert, E. & Buswell. Jr. **Encyclopedia of Buddhism**. Volume I.

Sakuma, Dutt. (1996) **Early Buddhist Monarchism**. New Delhi: Munshiram Manoharlal Publishers Pvt Ltd.

Swearer, Donald K. (1995) **The Buddhist World of Southeast Asia**. USA: State University of New York Press.

Eliiade, E. Mircea. (ed.) (1955) **Encylopaeda of Religion**. vol 5. New York.

Mode, X. (1996) **A Brief Introduction on Art History South and South East Asia**. Dresden Art Publisher and Mascova Publisher.

Gruge, Ananda W.P. (1975) **Buddhism the Religion and its Culture**. Colombo.

Qiu Ke and Zhang Jin. (1993) **A History of Chinese Culture**. Henan University Press.